# මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක අනුස්මරණ ත්‍යාගය

**01. ත්‍යාගයේ නම: මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක අනුස්මරණ ත්‍යාගය**

**02. දාතෘ: ශාස්ත්‍රපති පූජ්‍ය තපෝවනයේ සුතධර හිමි**

**03. නිමිත්ත:** කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අංශයේ සම්මානිත මහාචාර්ය, සාහිත්‍ය චක්‍රවර්ති, වාග්විද්‍යාව පිළිබඳ විඥාපක සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ව සිටි දිවංගත ඩබ්ලිව්. එස්. කරුණාතිලක මැතිතුමා වෙනුවෙන් මෙම ත්‍යාග පිහිටුවනු ලැබේ.

යාගොඩමුල්ල කනිෂ්ඨ විද්‍යාලයේ මූලික අධ්‍යාපනය නිම කළ ඩබ්ලිව්. එස්. කරුණාතිලක මැතිතුමා ද්විතීයික අධ්‍යාපනය ලැබුවේ මීනුවන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙනි. වර්ෂ 1956 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළු වූ කරුණාතිලක මහතා 1960 දී සංස්කෘත පිළිබඳ විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය විශිෂ්ට සමාර්ථය සහිත ව දිනාගැනීමෙන් අනතුරු ව ඉන්දියාවේ පූනා විශ්වවිද්‍යාලයෙන් වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ප්‍රථම පන්ති සාමාර්ථය සහිත ව සමත් විය. පසු ව ඇමරිකාවේ කෝනෙල් විශ්වවිද්‍යාලයෙන් වාග්විද්‍යාව පිළිබඳ දර්ශන විශාරද උපාධිය ලැබී ය.

උපාධිධාරී ගුරුවරයකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළ මහාචාර්ය කරුණාතිලක මහතා පසු ව සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හා අනුයුක්ත කොට තිබූ බෞද්ධ විශ්වකෝෂයෙහි සහකාර සංස්කාරවරයකු වශයෙන් බඳවාගනු ලැබී ය. ඉන් අනතුරු ව 1970 වසරේ දී කථිකාචාර්යවරයකු ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයට සම්බන්ධ වූ එතුමා 1974 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අධ්‍යයන අංශයෙහි කථිකාචාර්ය ධුරයට පත් විය.

වාග්විද්‍යා අධ්‍යයන අංශයෙහි අංශාධිපතිවරයා ලෙස වසර දහයකට අධික කාලයක් සේවය කළ එතුමා එම අංශයෙහි සංවර්ධනයට සුවිශාල මෙහෙයක් ඉටු කළ අතර විශ්‍රාම යන විට ද එම අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා මෙන් ම විඥාපක මහාචාර්යවරයා ද විය. එතුමා වරින් වර විද්‍යෝදය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය යන ආයතනවල බාහිර කථිකාචාර්යවරයකු සහ පශ්චාද් උපාධි උපදේශකවරයකු වශයෙන් ප්‍රශස්ත සේවයක් සිදු කර ඇත. මහාචාර්ය කරුණාතිලක මහතා ඇමරිකාවේ කෝනෙල් විශ්වවිද්‍යාලයෙහි බාහිර කථිකාචාර්යවරයකු මෙන් ම මහාචාර්යවරයකු වශයෙන් ද හාවඩ් විශ්වවිද්‍යාලයෙහි බාහිර මහාචාර්යවරයකු වශයෙන් ද කළ සේවය ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය යශෝකීර්තිය සඳහා උපස්තම්භක විය. එකී විද්‍යාස්ථානවල එතුමාගේ උපදේශකත්වය යටතේ ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද පශ්චාත් උපාධි පර්යේෂණ නිම කළ විද්‍යාර්ථීන්ගේ සංඛ්‍යාව අර්ධ ශතාධික වේ.

ශාස්ත්‍රීය කෘති, පාඨ ග්‍රන්ථ, ග්‍රන්ථ සංස්කරණ, කෝෂ ග්‍රන්ථ ආචාර ධර්ම සම්බන්ධ කෘති වශයෙන් එතුමා විසින් රචිත ග්‍රන්ථ විසි පහකට අධික වේ. එතුමා විසින් ලියන ලද **ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය** ඒ පිළිබඳව ලියැවුණු ප්‍රථම කෘතිය යි. එතුමාගේ **සිංහල භාෂා ව්‍යාකරණය** නම් කෘතියට 1996 වර්ෂයේ දී රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි විය. එතුමා විසින් සම කර්තෘත්වයෙන් රචිත **Literary**

**Sinhala, Readings in Colloquial Sinhala with Grammar and Notes, An Introduction to Spoken Sinhala, An Introduction to Spoken Tamil** සහ **An Introduction to Literary Tamil** යන කෘති සිංහල, දෙමළ භාෂෝද්ග්‍රහණයෙහි නියුක්ත දේශීය හා විදේශීය විද්‍යාර්ථීන්ගේ පුරෝගාමී පාඨග්‍රන්ථ බවට පත් වී ඇත.

සංස්කෘත භාෂාව පිළිබඳ එතුමා සතු විශේෂඥ දැනුම ප්‍රකට කරමින් ලියන ලද **සුභාරතීඃ සංස්කෘත භාෂා ප්‍රවේශය** යන කෘතිය සංස්කෘත භාෂා අධ්‍යයනය සඳහා මහඟු අත්වැලකි. **වාග්විද්‍යා ප්‍රවේශය** හා **භාෂා සමීක්ෂා** නම් ග්‍රන්ථ වාග්විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධි මෙන් ම පශ්චාත් උපාධි හදාරන සිසුන්ගේ විෂයඥානය පෘථුල කරයි. මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක මහතා ග්‍රන්ථ සංස්කරණය විෂයෙහි ද දක්වන මනා පටුත්වය එතුමා අතින් සංස්කරණය කෙරුණු **සිංහල ථූපවංශය** හා **ගුත්තිල කාව්‍යය** යන කෘතිවලින් මැනවින් ප්‍රදර්ශිත ය.

ද්විතීය භාෂා අධ්‍යයනයෙහි ලා ශබ්දකෝෂ ග්‍රන්ථ පරිහරණය අනිවාර්ය අවශ්‍යතාවකි. දෙමළ භාෂා ඥානය ලබාගැනීම ප්‍රායෝගික අවශ්‍යතාවක් බවට පත්ව ඇති වර්තමානයේ, එකී අරමුණු මස්තකප්‍රාප්ත කර ගැනීම පිණිසත් ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා සංස්කෘතික සංස්පර්ශය ඇති කිරීම පිණිසත් එතුමා විසින් සංග්‍රහිත **දෙමළ සිංහල අකාරාදිය** අතිශයින් වැදගත් වේ. දෙමළ වචනවලට සිංහල අරුත් දීම හැරුණු විට ග්‍රන්ථාවසානයෙහි පරිශිෂ්ට දහ හතරක් යටතේ දෙමළ භාෂාවේ ක්‍රියාරූප වරනැගීම, දෙමළ උද්භිද නාම, සත්ව නාම, දේශ නාම, ස්ථාන නාම, සංඛ්‍යා නාම, ව්‍යාධි නාම හා පාරිභාෂික පද ආදි වශයෙන් ඉදිරිපත් කොට ඇති මෙම කෘතිය දෙමළ භාෂාව පිළිබඳ ඥාන කෝෂයක් වශයෙන් හැඳින්වීම වඩාත් සුදුසු ය. එහි ම සංක්ෂිප්ත ශබ්ද කෝෂය ප්‍රායෝගික ඵලය සලකා රචනා කරන ලද්දකි. සිංහල භාෂා අධ්‍යයනයෙහි හා සාහිත්‍ය නිර්මාණකරණයෙහි නිරත කාහටත් ප්‍රයෝජනවත් වන **සිංහල විරුද්ධාර්ථ පද කෝෂය** සහ **පර්යාය පද කෝෂය** ද එතුමා විසින් රචිත තවත් කෝෂ ග්‍රන්ථ දෙකකි. ප්‍රාචීන හා ප්‍රතිචීන භාෂා දැනුමෙන් පරිපූර්ණ විද්වතුන් විරල මෙකල සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, දෙමළ, තෙලුගු, මලයාම් ආදි භාෂා පිළිබඳ පෘථුල දැනුමක් ඇති එතුමාගේ දීර්ඝ කාලීන පර්යේෂණවල ඵලයක් වන **Sinhala Etymological Lexicon** කෘතිය සිංහල ග්‍රන්ථ නාමාවලියට එකතු වන තවත් විශිෂ්ට කෘතියකි.

එතුමාගේ මූලික අරමුණ භාෂා අධ්‍යයනයෙහි යෙදීම වුව ද සාරධර්ම වර්ධනය කිරීමේ අභිප්‍රායෙන් රචිත **ශ්‍රී පද මාලා I, II, III** සහ **IV, V, VI, VII** කෘති ආගම්, ජාති, වයස් හා කාල භේදයකින් තොර ව කියවිය හැකි, කියවිය යුතු කෘති වේ.

එතුමාගේ පර්යේෂණ මූලික වශයෙන් ඓතිහාසික හා තුලනාත්මක වාග්විද්‍යා ක්ෂේත්‍ර මුල් කොටගෙන සිදු වුව ද සමාජයෙහි වෙනත් විද්වතුන්ගේ අවධානයට කලාතුරකින් ලක් වන භාෂා ව්‍යවහාර කෙරෙහි ද අවධානය යොමු කොට ඇත. වසර ගණනාවක් මුළුල්ලේ තෙලුගු භාෂාව පිළිබඳ කරන ලද පර්යේෂණය ඊට උදාහරණ යි. මෙරට අහිකුණ්ඨික ජනතාවගේ භාෂාව පිළිබඳ කරන ලද එම අධ්‍යයනය විද්වත් ලෝකයේ ඉමහත් පැසසුමට ලක් විය. එතුමා විසින් ලියන ලද වාග්විද්‍යාත්මක ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි මෙරට ශාස්ත්‍රීය සංග්‍රයන්හි පමණක් නොව ජාත්‍යන්තර

සඟරාවල ද පළ විය. එබඳු ලිපි සංඛ්‍යාත්මක වශයෙන් ශතාධික වේ. ග්‍රන්ථ විවේචන ද තිහක් පමණ වේ.

එතුමාගෙන් සිදු වූ සේවය හා එතුමා සතු විෂය විෂයාන්තර හා දර්ශන දර්ශනාන්තර දැනුම් සම්භාරය සලකා එතුමා වෙත පිරිනමන ලද තනතුරු අතරින් රාජකීය ආසියාතික සමිතියේ යාවජීව සාමාජික තනතුර දේශීය වශයෙන් ද, ඉන්දියානු වාග්විද්‍යා සංගමයෙහි යාවජීව තනතුර, ඇමරිකානු වාග්විද්‍යා සංගමයෙහි යාවජීව සමාජික තනතුර විදේශීය වශයෙන් ද සඳහන් කළ යුතු ය. විද්‍යාලංකාර පිරුවනින් වාග්විද්‍යා ශිරෝමණී සම්මානයෙන් ද, සීමා සහිත ගොඩගේ සහ සහෝදරයෝ ග්‍රන්ථ සමාගම මඟින් 2007 වර්ෂයේ විශිෂ්ට සාහිත්‍යවේදියාට පිරිනමන ගෞරව සම්මානයෙන් ද සර්වෝදය මඟින් විද්වතුන් සඳහා පිරිනැමෙන සම්මානය සහ කොළඹ තරුණ බෞද්ධ සංගමය මඟින් පිරිනැමෙන සම්මානයෙන් ද එතුමා පුදනු ලැබීය.

ඉහත සඳහන් කරුණු හැරුණු විට එතුමා පිළිබඳ ව විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණු කිහිපයක් වේ. එතුමා දයාවෙන් පිරි කරුණාවන්ත ගුරුවරයෙකි. ප්‍රතිපත්තිගරුක බෞද්ධයෙකි. විශ්‍රාමික සිය ගුරුවරුන් හා හිතවතුන් ඉඩ ඇති සෑම විටෙක ම මුණ ගැසී හැකි ආකාරයෙන් ඔවුන්ට උදව් උපකාර කිරීම මහාචාර්ය කරුණාතිලක මහතාගේ සිරිතක් විය. ඉහත ද සඳහන් කළ පරිදි බුද්ධ ධර්මයේ ව්‍යාප්තියට අදාළ ව ලිපි ලේඛන සකස් කළා පමණක් නොව අවට විහාරස්ථානවල දියුණුවට ද හැකි සෑම අයුරෙන්ම උදව් උපකාර කළේ ය. සංඝ ශාසනයෙහි දියුණුවට ද හැකි සෑම අයුරෙන් ම උදව් උපකාර කළේ ය. උක්ත ත්‍යාගය එතුමා වෙනුවෙන් පිහිටුවීම ඉතා යෝග්‍ය වේ.

**04. ත්‍යාගයේ ස්වභාවයඃ** මෙම ත්‍යාගය වර්ෂයකට එක් වරක් පමණක් ප්‍රදානය කරනු ලැබේ. පූජ්‍ය තපෝවනයේ සුතධර හිමියන් විසින් කැලණිය විශ්වවිද්‍යාලයට ප්‍රදානය කරනු ලබන රුපියල් ලක්ෂ හයක මුදල කැලණිය විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන බැංකුවක තැන්පත් කරනු ලැබේ. එම මුදලට හිමි වන වාර්ෂික පොලිය සම කොටස් හයකට බෙදනු ලැබේ.

එක් කොටසක් ප්‍රථම වර්ෂ පරීක්ෂණයේ දී වාග්විද්‍යාව විෂය සඳහා වැඩිම ලකුණු ලබාගන්නා විද්‍යාර්ථියාට ද, දෙවන කොටස වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) පාඨමාලාවේ ප්‍රථම වර්ෂ පරීක්ෂණයේ දී වැඩි ම ලකුණු ලබාගන්නා විද්‍යාර්ථියාට ද, තුන් වන කොටස වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) පාඨමාලාවේ දෙවන වසර පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගන්නා විද්‍යාර්ථියාට ද, හතරවන කොටස වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) පාඨමාලාව හදාරා තුන් වන වසර පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට, පස් වන කොටස ප්‍රථම වර්ෂයේ දී වාග්විද්‍යාව සහ සංස්කෘත විෂයන් හදාරා සංස්කෘත විෂය සඳහා වැඩිම ලකුණු ලබාගන්නා විද්‍යාර්ථියාට ද, සය වන කොටස ප්‍රථම වර්ෂයේ දී වාග්විද්‍යාව හා බෞද්ධ පාළි විෂයයන් හදාරා පාළි විෂය සඳහා වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට ද හිමි වේ.

05. ත්‍යාග ලාභියාගේ ආගම, ජාතිය, ස්ත්‍රීපුරුෂභාවය හෝ ගිහිපැවිදිබව යන ප්‍රභේද මෙම ත්‍යාගය ලබාගැනීමට නුසුදුසුකමක් නොවේ.

06. එසේ ම, විවිධ කරුණු මුල් කොටගෙන පිහිටුවා ඇති වෙනත් ත්‍යාග ලැබීම මෙම ත්‍යාග ලැබීමට නුසුදුසුකමක් නොවේ.

**07. ත්‍යාගය ප්‍රදානය කිරීමේ දිනය හා ස්ථානය:** අදාළ වර්ෂවල අවසාන විභාග ප්‍රතිඵල නිකුත් වීමෙන් අනතුරු ව එළඹෙන අධ්‍යයන වාරයේ මානවශාස්ත්‍ර පීඨ රැස්වීමක දී හෝ විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරනු ලබන විශේෂ රැස්වීමක දී උක්ත ත්‍යාග ප්‍රදානය කළ හැකි ය. ඉහත අංක 01 යටතේ දැක්වෙන අවශ්‍යතා සපුරාලන විද්‍යාර්ථියාට ලිපියක් මගින් ත්‍යාගය පිළිබඳව දැනුම් දෙනු ලැබේ. අදාළ ත්‍යාග ලාභියා තෝරාගනු ලබනුයේ තේරීම් මණ්ඩලය විසිනි. ත්‍යාග/ත්‍යාගයක් සඳහා සුදුස්සකු නොමැති විටෙක අදාළ පොලිය නැවත මුල් මුදලට බැර කරනු ලැබේ.

**08. ත්‍යාග තේරීම් මණ්ඩලය:**

*i).* මානවශාස්ත්‍ර පීඨාධිපතිතුමා

*ii).* වාග්විද්‍යා අංශප්‍රධානවරයා

*iii).* වාග්විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා හෝ එසේ නොමැති විටෙක ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙක්

*iv). ICCMS* – අධ්‍යක්ෂක

**09. ත්‍යාග ප්‍රදානය කරනු ලබන මුල් අවස්ථාව:** 2014 වර්ෂයේ දී අංක 01හි සඳහන් අවශ්‍යතා සපුරාලන විද්‍යාර්ථියාට මුල් වරට ත්‍යාග පිරිනමනු ලැබේ.

**10. ශිෂ්‍යත්ව අරමුදලේ මූල්‍ය කටයුතු සඳහා:** වාග්විද්‍යා අංශයෙහි අංශාධිපතිවරයා සහ වාග්විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා හෝ එසේ නොමැති විටෙක ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙක් සියලු මූල්‍ය කටයුතු සඳහා අත්සන් කළ යුතු වේ.